පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 09 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- **බුද්ධ ධර්මය I,II**

පාසලේ නම : ....................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය. 2 යි

## I පත්‍රය

- **ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ධර්ම විනය නිවැරදි ලෙස තේරුම් ගැනීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත වන සතර මහාපදේශ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනු ලැබූයේ.
1. විශාලා මහනුවර දී ය. 2. ජම්බු ග්‍රාමයේ දී ය.
3. භෝග නගරයේ දී ය. 4. පාවා නුවර දී ය

02. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදී ම පැවිදිව, රහත්වූ බුදු සසුනේ අන්තිම ශ්‍රාවකයා වීමේ භාග්‍යය උදා වූයේ.
1. සුභද්‍ර හිමියන්ට ය. 2. ආනන්ද හිමියන්ට ය.
3. වක්කලී හිමියන්ට ය. 4. නන්ද හිමියන්ට ය.

**03. සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා**
**සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා** ලෝවැඩ සඟරාවේ සඳහන් මෙම කවියෙන් වන්දනා කරන්නේ,
1. බුද්ධ රත්නයට යි. 2. ධම්ම රත්නයට යි
3. සංඝ රත්නයට යි. 4. ත්‍රිවිධ රත්නයට යි.

04. සබරගමු පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී පාදස්ථානය බෞද්ධයාට වැදගත් වන්නේ,
1. බුදුරජාණන් වහන්සේගේ වම් සිරිපා ලකුණ පිහිටුවා තිබීම නිසා ය.
2. බුදුරජාණන් වහන්සේගේ දකුණු සිරිපා ලකුණ පිහිටුවා තිබීම නිසා ය.
3. සමන් දේවාලය පිහිටුවා තිබීම නිසා ය.
4. රට මැද පිහිටි ස්ථානයක් නිසා ය.

05. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂුණීන් වහන්සේලාගේ විනය පවත්වා ගෙන යාමට කරන ලද දේශනාව වන්නේ,
1. අෂ්ට ලෝක ධර්ම දේශනාවයි. 2. නන්දකෝවාද සූත්‍රයයි.
3. සඳකිඳුරු ජාතකයයි. 4. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයයි.

06. පුද්ගලයාගේ කායික වාචසික ශික්ෂණය බුදු දහමේ හඳුන්වන්නේ,
1. දානය නමින් ය. 2. සීලය නමින් ය.
3. භාවනාව නමින් ය. 4. පරිත්‍යාගය නමින් ය.

07. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් යුතුකම් අතර ස්වාමියාට පළමුව අවදි වීම, ස්වාමියාට පසුව නිදා ගැනීම.... ආදී යුතුකම්,
1. සේව්‍යයාගේ යුතුකම් ය. 2. සේවකයාගේ යුතුකම් ය.
3. බිරිඳගේ යුතුකම් ය. 4. යහලුවාගේ යුතුකම් ය.

08. දුකට මුල් වන්නා වූ තෘෂ්ණාව මුළුමනින්ම නැසීමේ දී අත් හැරීමක් වේද, නිවීමක් වේද, නොඇලීමක් වේද, එය,
1. ආත්මය වේ. 2. නිවන වේ.
3. සංස්කාර වේ. 4. භවය වේ.

09. බුදුරජාණන් වහන්සේගේ පළමු දම් දෙසුම වන්නේ,
1. මහාමංගල සූත්‍රය යි. 2. කරණීය මෙත්ත සූත්‍රය යි.
3. අනත්තලක්ඛණ සූත්‍රය යි. 4. දම්සක් පැවතුම් සූත්‍රය යි.

10. සසර දුකින් එතෙර වීමට අන්තවාදී පිළිවෙත්වලින් බැහැරව මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටිය යුතුය. චතුරාර්ය සත්‍යයෙහි මධ්‍යම ප්‍රතිපදාව විස්තර කර ඇත්තේ,
1. දුක්ඛ ආර්ය සත්‍යයෙන් ය. 2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙන් ය.
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයෙන් ය. 4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයෙන් ය.

11. කයින් සිදුවන අකුසල ක්‍රියාවකි,
1. පරපණ නැසීම 2. බොරු කීම
3. දැඩි ලෝභය 4. වැරදි විශ්වාසය

12. පෙර භවයක දී තම දෙමාපියන් කැලයට ගෙන ගොස් පහර දී මරා දැමූ පාප ක්‍රියාව නිසා මේ භවයේ සොරුන්ගෙන් පහර කෑමට ලක් වූ මහ රහතන් වහන්සේ,
1. සැරියුත් මහ රහතන් වහන්සේ ය. 2. මුගලන් මහ රහතන් වහන්සේ ය.
3. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය. 4. සීවලී මහ රහතන් වහන්සේ ය.

13. පටිච්ච සමුප්පාද ධර්මය විස්තර කරන **''ඉමස්මිං සති ඉදං හෝති''** යන පාඨයෙහි අර්ථය වනුයේ,
1. මෙය ඇති කල්හි මෙය වේ. 2. මෙය හට ගැනීමෙන් මෙය හට ගනී.
3. මෙය නැති කල්හි මෙය නොවේ. 4. මෙය නැතිව යාමෙන් මෙය නැති වේ.

14. තමන් දඬුවමට, මරණයට බිය වන්නාක් මෙන් සියලු සතුන් ද එයට බිය වන බව නිතර නිතර මෙනෙහි කිරීම හඳුන්වන්නේ,
1. පංච ශීලය නමින් ය. 2. අත්තූපනායක ධර්ම නමින් ය.
3. ලෝකාධිපති ධර්ම නමින් ය. 4. ධම්මාධිපති ධර්ම නමින් ය.

15. තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය කුමක් ද?
1. කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමය 2. රජගහ නුවර සප්තපර්ණී ගල් ගුහා ද්වාරය
3. විශාලා මහ නුවර වාලුකාරාමය 4. පැළලුප් නුවර අශෝකාරාමය

16. බුදු දහමේ ශ්‍රද්ධාව පිළිබඳව ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. කෙනෙකුගේ පිරිසිදුකම හැඳින ඇති කර ගන්නා පැහැදීම ශ්‍රද්ධාවයි.
2. තෙරුවන් ගුණ හැඳින ඇතිකර ගන්නා පැහැදීම ශ්‍රද්ධාවයි.
3. උගත්කම පිළිබඳව ඇති කර ගන්නා පැහැදීම ශ්‍රද්ධාවයි.
4. පිරිස් බලය දැක ඇති කර ගන්නා පැහැදීම ශ්‍රද්ධාවයි.

17. පූජනීය ස්ථානයකට ඇතුළු වන දොරටුවෙහි සඳකඩපහණට දෙපසින් පිහිටුවා ඇති අර්ධ කවකාර මුදුන සහිත ඍජුකෝණාස්‍රාකාර ගල් පුවරු දෙක හඳුන්වන්නේ,
1. මුරගල නමිනි. 2. කොරවක් ගල නමිනි.
3. පහන් ගල නමිනි. 4. මායිම් ගල නමිනි.

18. රුවන්වැලි මහා සෑයේ ඉතිහාස කතාව විස්තර වන ථූපවංශය නැමති ග්‍රන්ථය රචනා වූ යුගය වන්නේ,
1. අනුරාධපුර යුගය යි. 2. පොළොන්නරු යුගය යි.
3. දඹදෙණි යුගය යි. 4. කුරුණෑගල යුගය යි.

19. දස රාජ ධර්ම පිළිබඳ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
1. රාජ්‍ය පාලන මූල ධර්මයක් ලෙස පිළිගත හැකිය.
2. ජනතා හිතවාදී උපදෙස් ඇතුළත් ය.
3. රාජ්‍ය පාලනයට සම්බන්ධ කරුණු 10ක් ඇතුළත් ය.
4. බුදු ගුණ 10 ක් පිළිබඳ විස්තර ඇතුළත් ය.

20. **"ශ්‍රමණය මම සී සාමි, වපුරමි, සීසා වපුරා අනුභව කරමි, ඔබ ද එසේ කරන්න....."** බුදුරජාණන් වහන්සේ ට මෙලෙස පරිභව කළේ,
1. අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා ය. 2. කසි භාරද්වාජ බ්‍රාහ්මණයා ය.
3. අක්කෝසක භාරද්වාජ බ්‍රාහ්මණයා ය. 4. සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණයා ය.

* *

ලකුණු (2x20 =40)

## II පත්‍රය

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01.

I. බුදු සිරිතෙහි විශිෂ්ට ලක්ෂණ **දෙකක්** ලියන්න.
II. සොළොස්මස්ථාන අතර රුවන්වැලිසෑය හා ථූපාරාමය ආගමික වශයෙන් වැදගත් වීමට හේතු **පිළිවෙළින්** ලියා දක්වන්න.
III. ආනාපානාසති භාවනාවේ ප්‍රයෝජන **දෙකක්** ලියන්න.
IV. බුදු සසුනෙහි අග්‍ර ශ්‍රාවක **දෙනම** නම් කරන්න.
V. සියලු සත්ත්වයෝ ජීවත් වන්නේ ආහාරයෙනි. ආහාර ගැනීමෙන් අප බලාපොරොත්තු විය යුතු කරුණු **දෙකක්** ලියන්න.
VI. දඹදෙණි යුගයේ රචිත, බුදුරජාණන් වහන්සේ සියලු **ලෝකවාසීන්ගෙන් පූජා ලැබීමට සුදුසු** බව විස්තර කරන කෘතිය හා **කුස ජාතක කතාව ඇසුරෙන් බෝධිසත්ව චරිතය** වර්ණනා කරන කෘතිය පිළිවෙළින් නම් කරන්න.
VII. ශ්‍රද්ධාවේ ප්‍රභේද **දෙක** ලියා දක්වන්න.
VIII. දස රාජ ධර්ම අතරින් **දෙකක්** ලියන්න.
IX. **පළමුව අත්** **සෑමට** ............ යන කවිය සම්පූර්ණ කරන්න.
X. කයෙන් සිදුවන අකුසල ක්‍රියා **දෙකක්** ලියා දක්වන්න. (ල. 2 x 10 = 20)

02.

I. **සුකරානි අසාධූනි** ....... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)
II. එම ගාථාවෙහි **අර්ථය** ලියන්න. (ලකුණු 3)
III. "අසාධු ධර්මයන් ගෙන් වෙන් වීම පහසු නොවේ" මෙම ප්‍රකාශය ධම්මපද ගාථා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

03.

I. බලංගොඩ ආනන්ද මෛත්‍රිය නා හිමිපාණන් වහන්සේට හිමි වූ ගෞරව නාම දෙකක් ලියන්න. (ලකුණු 2)
II. උන් වහන්සේ රචනා කරන ලද කෘති **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 3)
III. **"ආනන්ද මෛත්‍රිය නාහිමියන්ගෙන් අපට ගතහැකි ආදර්ශ"** පිළිබඳ පුවත් පතකට ලිපියක් සකසන්න (ලකුණු 5)

04.

I. ආර්ය අෂ්ටාංගික මාර්ගය විස්තර කරන ආර්ය සත්‍යය කුමක් ද? (ලකුණු 2)
II. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ශීල ශික්ෂාවට අයත් **අංග** නම් කරන්න. (ලකුණු 3)
III. ආර්ය අෂ්ටාංගික මාර්ගය මෙලොව ජීවිතයට අස්වැසිල්ලක් වන අයුරු විස්තර කරන්න. (ලකුණු 5)

05.

I. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට මුල් වූ **ප්‍රධාන** හේතුව ලියන්න. (ලකුණු 2)
II. එම සංගායනාවේ මූලිකත්වය, අනුග්‍රාහකත්වය හා පැවැත් වූ ස්ථානය පිළිවෙළින් ලියන්න. (ලකුණු 3)
III. ශාසනයේ චිර පැවැත්මට දෙවන ධර්ම සංගායනාව උදව් වූ ආකාරය විමසන්න. (ලකුණු 5)

06.

I. අධාර්මික ජීවිකාවෙන් මිදී ධර්මානුකූලව ධනය උපයා දිවි පැවැත්වීම හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 2)
II. තුලා කූට, මාන කූට, කංස කූට යන වචනවල අදහස ලියන්න. (ලකුණු 3)
III. අනුන්ට ණය නොවී ජීවත් වීමෙන් ඇති වාසි මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 5)

07.

I. ලොව ජීවත් වීමේ අයිතිය සෑම සත්ත්වයෙකුටම පොදු බව කියැවෙන පංච ශීලයෙහි ශික්ෂා පදය ලියන්න. (ලකුණු 2)
II. **ත්‍රිකෝටික පාරිශුද්ධ** ශීලය නම් කරන්න. (ලකුණු 3)
III. යහපත් සමාජයක් සඳහා **ලෝක පාලක ධර්මයට** අනුව කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 5)

* * *

# 9 - ශ්‍රේණිය
# අවසාන වාර පරීක්ෂණය 2023
## පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. 03 | 02. 01 | 03. 03 | 04. 01 | 05. 04 |
| 06. 02 | 07. 02 | 08. 02 | 09. 04 | 10.-04 |
| 11. 01 | 12. 02 | 13. 01 | 14. 02 | 15. 04 |
| 16. 02 | 17. 01 | 18. 04 | 19. 04 | 20. 02 |

## II පත්‍රය

01.

I. ආදර්ශවත් බව, චරිතවත් බව, යථාවාදී තථාකාරී බව, යථාකාරී තථාවාදී බව, සමානාත්මතාව, අකම්පිත බව, අගතිගාමී නොවීම, කාරුණික බව, නම්‍යශීලීත්වය, ඍජු බව, නිවැරදි තීරණ ගැනීම, නිවැරදි දැක්ම, ආකර්ශණීය වාග් විලාසය, ආකර්ශණීය රූප විලාසය, ස්ථානෝචිත ප්‍රඥාව, බහුශ්‍රැත බව යන පිළිතුරු අතරින් දෙකක්.

II. රුවන්වැලි සෑය – සර්වඥ ධාතූන් වැඩි ප්‍රමාණයක් නිදන් කොට තිබීම./ද්‍රෝණයක් ධාතූන් නිදන් කොට තිබීම.

ථූපාරාමය – බුදු රදුන්ගේ අකුධාතුව නිදන් කොට තිබීම.

III. සිත සන්සුන් කරගත හැකිය, විෂය කරුණු පහසුවෙන් ධාරණය කරගත හැකිය, නුවණ දියුණු වේ, ඕනෑම කටයුත්තක සාර්ථක ප්‍රතිඵලයක් අත්කර ගත හැකිය.

IV. සැරියුත් මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ

V. ශරීරයේ යහපැවැත්ම, යැපීම, උපන් කුසගිනි වේදනා දුරු කරගැනීම, නූපන් කුසගිනි වේදනා වැළැක්වීම, ආයුෂ, වර්ණ, සැප, බල මෙන්ම නුවණ දියුණු කර ගැනීම.

VI. පූජා වලිය (පූජා ලැබීමට සුදුසු බව විස්තර කරන), **කව් සිළුමිණ** (කුස ජාතකය ඇසුරින්)

VII. අකාරවතී සද්ධා, අමූලිකා සද්ධා

VIII. දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, ක්‍රෝධ නොවීම, අවිහිංසාව, ඉවසීම, විරුද්ධ නොවීම අතරින් පිළිතුරු දෙකක්.

IX. පළමුව අන් සැමට
නිසි වන බැවින් පිදුමට
මහ සඟරුවන සෙට
පාහුනෙය්‍යායි අනුව දහමට

X. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිත්‍යාචාරය, (පරපණ නැසීම/සත්ව හිංසාව, සොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම.)

02.

I. සුකරානි අසාධූනී – අත්තනෝ අහිතානිච
යං වේ හිතං ච සාධුංච – තං වේ පරම දුක්කරං

II. අයහපත් දෑ මෙන්ම තමාට අහිත පිණිස හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකිය. යහපත් දෑ මෙන්ම තමාට හිතකර වූ දේ කිරීම ඉතාම දුෂ්කරය.

III. අසාධු යනු අයහපත් දේ බව අර්ථ ගන්වා අයහපත් දේ කිරීම ඉතාම පහසු බවත්, අයහපත් දේ කිරීමෙන් තමන් පිරිහීමට පත්වනවා මෙන්ම ඇසුරු කරන අයත් පිරිහීමට පත් වන බව අදහස් වේ නම් පිළිතුර සමස්ථයක් සේ සලකා සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (07 පාඩම 46, 47 පිටු බලන්න.)

03.

I. සාහිත්‍ය සූරි, අග්ගමහා පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්තී , අභිධජ මහා රට්ඨගුරු, මේවායින් දෙකක්.

II. බුද්ධ චරිතය, ශ්‍රී ශාක්‍ය මුනීන්ද්‍රාවදානය / සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය

III. හිමිනමකට අවශ්‍ය බණ දහම් මැනවින් ප්‍රගුණ කිරීම, සරල දිවි පැවැත්ම, අනතිමානි බව, ශික්ෂාකාමී බව, බුදු සසුන වෙනුවෙන් සුවිසල් මෙහෙයක් කළ බව, බෞද්ධ විරෝධින්ට මුහුණ දීමට කටයුතු කළ බව, උන් වහන්සේ විසින් රචිත කෘති රාශියක් ඇති බව, නිරන්තරයෙන් භාවනාව ප්‍රගුණ කළ බව ආදි කරුණු වලින් තුනක් වත් සහිතව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (11 පාඩම බලන්න.)

04.

I. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්‍ය සත්‍ය

II. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

III. ත්‍රි ශික්ෂාවට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අට ජීවිතයට පුහුණු කර ගැනීමෙන් මෙලොව ජීවිතය සතුටින් ගත කළ හැකි බව පැහැදිලි වන සේ පිළිතුරු සැකසී ඇත්නම් සමස්ථයක් සේ සලකා ලකුණු ලබා දෙන්න. ( 15 පාඩම බලන්න.)

05.

I. වජ්ජි පුත්තක භික්ෂූන් විසින් ක්‍රියාත්මක කරන ලැබූ විනය විරෝධි දස වස්තුව/ වජ්ජි පුත්තක භික්ෂුන්ගේ දස අකැප වස්තුව

II. මූලිකත්වය - සබ්බකාමී මහ රහතන් වහන්සේ

අනුග්‍රහකත්වය - කාලාශෝක රජතුමා

පැවැත්වූ ස්ථානය - විශාලා මහ නුවර වාලුකාරාමය

III. 20 වන පාඩමේ 124 පිටුවේ ඇති ප්‍රතිපල වලින් දෙකක් වත් ඇතුලත්ව ඇත්නම් සමස්ථයක් සේ ෂලකා ලකුණු ලබා දෙන්න.

06.

I. සම්මා ආජීව

II. තුලා කූට - හොර කිරුම් උපකරණ භාවිතය මාන කූට - හොර මිනුම් ක්‍රම භාවිතය

කංස කූට - ව්‍යාජ භාණ්ඩ අලෙවිය

III. ණය නැතැයි අතිවන සතුට, අනුන්ට ණය නොමැති කම නිසා ඇතිවන අත්ම අභිමානය , ණය කාරයෙකු වීමෙන් කෙනෙකුට මුහුණ දීමට සිදුවන ගැටලු නොමැති වීම නිසා ඇතිවන ආත්ම ගෞරවය යන ආදී කරුණු ඇතුලත් පිළිතුරට ලකුණු ලබා දෙන්න. (22 පාඩම)

07.

I. පාණාතිපාතා වේරමණී ශික්ෂාපදං සමාදියාමි.

II. පව්කම් නොකිරීම, පව්කම් නොකරවීම, අන් අය කරන විට එය අනුමත නොකිරීම යන අංග තුනෙන් අරක්ෂා වීමයි.

III. ලෝක පාලක ධර්ම හැදින්වීම එය යහපත් සමාජයකට බලපාන අයුරු පැහැදිලි කර තිබීම අවශ්‍ය වේ. (9 පාඩම)

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**